මගේ අංකය :- JSC/SEC/CIR/2023

**සියලුම අධිකරණ නිලධාරීන් වෙත,**

**<u>මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කාර්යාංශය යටතේ පවතින මධ්‍යස්ථාන වෙත යොමු කිරීම</u>**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත යොමු කර ඇති 2023.06.22 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 දෙසැම්බර් මස 01 වෙනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ANNEXE


ලේකම් / செயலாளர் / Secretary — දුරකථනය / தொலைபேசி / Telephone 2449959; ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office — දුරකථනය / தொலைபேசி / Telephone 2323022; ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785

Web Site: www.moj.gov.lk


# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

# Ministry of Justice, Prison Affairs and Constitutional Reforms


P.O. Box.

ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail: info@moj.gov.lk

නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த, கொழும்பு 10
No 19, Sri Sangaraja Mw, Colombo 10


මගේ අංකය / எனது இல / My No. MOJ/L2/06/43

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023.06.22

COLOMBO 12 JUDICIAL SERVICE 22 JUN 2023

එච්.එස්. සෝමරත්න මයා
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

**<u>මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කාර්යාංශය යටතේ පවතින මධ්‍යස්ථාන වෙත යොමු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක. MOJ/L13/JSC/2020 හා 2022.08.29 දිනැති ලිපිය හා බැඳේ. (පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

ඒ අනුව, එකී ලිපියෙහි කරුණු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ අංක 12/2022 දරන චක්‍රලේඛය මඟින් සියළුම විනිශ්චයකාරවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

කෙසේ වුවද, මේ වන විට බන්ධනාගාර තුළ අධික තදබදයක් ඇති කරමින්, 2023.06.15 වන දින වන විට බන්ධනාගාරගත මුළු රැඳවියන් ප්‍රමාණය 26574 ක් බවට ඉහළ ගොස් ඇති අතර ඔවුන් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් (14130ක් පමණ) මත්ද්‍රව්‍ය වැරදි වලට දඬුවම් ලැබූ හෝ ඒ සම්බන්ධව රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින පිරිස වන බවට කරුණු අනාවරණය වී ඇත.

එසේ හෙයින්, මේ වන විට චක්‍රලේඛ අංක. 12/2022 මඟින් යොමු කොට ඇති නිර්නායකයන් අතුරින් "අ" සහ "ඇ" යන නිර්නායකයන් සම්බන්ධයෙන් ඇමුණුමෙහි දක්වා ඇති පහත සංශෝධනයන්ට යටත්ව, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූ බන්ධනාගාරගත කරනු ලබන රැඳවියන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කාර්යාංශය මඟින් ස්ථාපනය කර ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත ඇතුළත් කර ගැනීමට කටයුතු කිරීමට තීරණය කර ඇති බැවින්, එකී සංශෝධන පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ගරු මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

(1) පුනරුත්ථාපනය සඳහා යොමු කරනු ලබන රැඳවියන්ගේ උපරිම වයස් සීමාව අවු 45 සිට 60 දක්වා වැඩි කිරීම.

(2) දරුණු ගණයේ අපරාධ නඩු වලට හැර (මිනී මැරුම් චෝදනා, ස්ත්‍රී දූෂණ හා මංකොල්ලකෑම් ආදිය) සුළු වැරදි සඳහා ගරු අධිකරණයන්හි විභාග වෙමින් පවතින නඩු සඳහා යොමු කළ යුතු අයවළුන්

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය